**UNIVERSITY OF PERADENIYA**
**පේරාදෙණිය විශ්වවිද්‍යාලය**
**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION**
**දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) – 2020 (November 2021)
**ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - 2020 (2021 නොවැම්බර්)**

Pali - I / පාලි - I : PLG - 1
(නිර්දිෂ්ට ග්‍රන්ථ)

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
(මෙම පත්‍රයට ඇතුළත් ප්‍රශ්න සංඛ්‍යාව 05 කි.)
සෑම පිළිතුරකට ම සමාන ලකුණු ලැබේ. (කාලය පැය තුනයි )

---

1. (අ) සිංහලට නගන්න.

"සුණාතු මෙ, භන්තෙ, සඞ්ඝො. සඞ්ඝො ඉත්ථන්නාමං විහාරං භණ්ඩාගාරං සම්මන්නති. යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස විහාරස්ස භණ්ඩාගාරස්ස සම්මුති, සො තුණ්හස්ස; යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

"සම්මතො සඞ්ඝෙන ඉත්ථන්නාමො විහාරො භණ්ඩාගාරං. ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී, එවමෙතං ධාරයාමී"ති.

තෙන ඛො පන සමයෙන සඞ්ඝස්ස භණ්ඩාගාරෙ චීවරං අගුත්තං හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. අනුජානාමි, භික්ඛවෙ, පඤ්චහඞ්ගෙහි සමන්නාගතං භික්ඛුං භණ්ඩාගාරිකං සම්මන්නිතුං – යො න ඡන්දාගතිං ගච්ඡෙය්‍ය, න දොසාගතිං ගච්ඡෙය්‍ය, න මොහාගතිං ගච්ඡෙය්‍ය, න භයාගතිං ගච්ඡෙය්‍ය, ගුත්තාගුත්තඤ්ච ජානෙය්‍ය. එවඤ්ච පන, භික්ඛවෙ, සම්මන්නිතබ්බො. පඨමං භික්ඛු යාචිතබ්බො; යාචිත්වා බ්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො –
"සුණාතු මෙ, භන්තෙ, සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුං භණ්ඩාගාරිකං සම්මන්නෙය්‍ය. එසා ඤත්ති."

(ම.ව. චීවරක්ඛන්ධකං)

(ආ) ආරාමික ජීවිතයේ විධිමත් කළමනාකරණයක් සඳහා ඛන්ධක විනයෙන් ලැබෙන මාර්ගෝපදේශකත්වය පිළිබඳ විමසීමක් කරන්න.

2. (අ) සිංහලට නගන්න.

"ඉති කිර, වාසෙට්ඨ, නත්ථි කොචි තෙවිජ්ජානං බ්‍රාහ්මණානං එකබ්‍රාහ්මණොපි, යෙන බ්‍රහ්මා සක්ඛිදිට්ඨො. නත්ථි කොචි තෙවිජ්ජානං බ්‍රාහ්මණානං එකාචරියොපි, යෙන බ්‍රහ්මා සක්ඛිදිට්ඨො. නත්ථි කොචි තෙවිජ්ජානං බ්‍රාහ්මණානං එකාචරියපාචරියොපි, යෙන බ්‍රහ්මා සක්ඛිදිට්ඨො. නත්ථි කොචි තෙවිජ්ජානං බ්‍රාහ්මණානං යාව සත්තමා ආචරියාමහයුගා යෙන බ්‍රහ්මා සක්ඛිදිට්ඨො. යෙපි කිර තෙවිජ්ජානං බ්‍රාහ්මණානං පුබ්බකා ඉසයො මන්තානං කත්තාරො මන්තානං පවත්තාරො, යෙසමිදං එතරහි තෙවිජ්ජා බ්‍රාහ්මණා පොරාණං මන්තපදං ගීතං පවුත්තං සමිහිතං, තදනුගායන්ති, තදනුභාසන්ති, භාසිත–මනුභාසන්ති, වාචිතමනුවාචෙන්ති, සෙය්‍යථිදං – අට්ඨකො වාමකො වාමදෙවො වෙස්සාමිත්තො යමතග්ගි අඞ්ගීරසො භාරද්වාජො වාසෙට්ඨො කස්සපො භගු, තෙපි න එවමාහංසු – 'මයමෙතං ජානාම, මයමෙතං පස්සාම, යත්ථ වා බ්‍රහ්මා, යෙන වා බ්‍රහ්මා, යහිං වා බ්‍රහ්මා'ති. තෙව තෙවිජ්ජා බ්‍රාහ්මණා එවමාහංසු – 'යං න ජානාම, යං න පස්සාම, තස්ස සහබ්‍යතාය මග්ගං දෙසෙම. අයමෙව උජුමග්ගො අයමඤ්ජසායනො නිය්‍යානිකො, නිය්‍යාති තක්කරස්ස බ්‍රහ්මසහබ්‍යතායා"ති.

(දී.නි. තෙවිජ්ජසුත්තං)

අනෙක් පිටුවට ...

(ආ) ත්‍රිවිද්‍යාව පිළිබඳ බ්‍රාහ්මණික අදහස බුදුරජාණන් වහන්සේගේ විවේචනයට ලක්වූ හේතු පැහැදිලි කරන්න.

3. (අ) සිංහලට නගන්න.

අථ ඛො සුබ්‍රහ්මා පච්චෙකබ්‍රහ්මා ද්විසහස්සක්ඛත්තුං අත්තානං අභිනිම්මිනිත්වා තං බ්‍රහ්මානං එතදවොච "පස්සසි මෙ නො ත්වං, මාරිස, එවරූපං ඉද්ධානුභාව"න්ති? "පස්සාමි ඛො ත්‍යාහං, මාරිස, එවරූපං ඉද්ධානුභාව"න්ති. "තයා ච ඛො, මාරිස, මයා ච ස්වෙව භගවා මහිද්ධිකතරො චෙව මහානුභාවතරො ච. ගච්ජෙය්‍යාසි ත්වං, මාරිස, තස්ස භගවතො උපට්ඨානං අරහතො සම්මාසම්බුද්ධස්සා"ති? අථ ඛො සො බ්‍රහ්මා සුබ්‍රහ්මානං පච්චෙකබ්‍රහ්මානං ගාථාය අජ්ඣභාසි

"තයො සුපණ්ණා චතුරො ච හංසා – බ්‍යග්ඝීනියා පඤ්චසතා ච ඣායිනො,
තයිදං විමානං ජලතෙ ච බ්‍රහ්මෙ – ඔභාසයං උත්තරස්සං දිසාය"න්ති.

"කිඤ්චාපි තෙ තං ජලතෙ විමානං – ඔභාසයං උත්තරස්සං දිසායං,
රූපෙ රණං දිස්වා සදා පවෙධිතං – තස්මා න රූපෙ රමතී සුමෙධො"ති.

(සං.නි. බ්‍රහමසංයුත්තං)

(ආ) බ්‍රහ්ම සංකල්පය විවේචනයට ලක්වූ ආකාරය හා බුද්ධකාලීන සමාජයේ එමගින් ඇතිවූ චින්තනමය පරිවර්තනය පැහැදිලි කරන්න.

4. (අ) සිංහලට නගන්න.

"කෙන තෙතාදිසො වණ්ණො – කෙන තෙ ඉධ මිජ්ඣති,
උප්පජ්ජන්ති ච තෙ භොගා – යෙ කෙචි මනසො පියා.

පුච්ඡාමි තං දෙවි මහානුභාවෙ – මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං,
කෙනාසි එවං ජලිතානුභාවා – වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති.

අහං මත්තා තුවං තිස්සා – සපත්තී තෙ පුරෙ අහුං,
පාපකම්මං කරිත්වාන – පෙතලොකං ඉතො ගතා.

තව දින්නෙන දානෙන – මොදාමි අකුතොභයා,
චිරං ජීවාහි භගිනි – සහ සබ්බෙහි ඤාතිහි
අසොකං විරජං ඨානං – ආවාසං වසවත්තිනං.

ඉධ ධම්මං චරිත්වාන – දානං දත්වාන සොභනෙ,
විනෙය්‍ය මච්ඡෙරමලං සමූලං – අනින්දිතා සග්ගමුපෙහි ඨාන"න්ති.

(පෙතවත්‍ථු-උබ්බරීවග්ගො)

අනෙක් පිටුවට ...

(ආ) "මුල් බුදුසමයේ කර්ම සංකල්පය පිළිබඳ සංවර්ධිත අදහසක් පේතවත්ථු කතා ඇසුරින් ප්‍රකට වේ." විමසන්න.

5. (අ) සිංහලට නගන්න.

තෙන ඛො පන සමයෙන රාජගහං පරිවාරෙත්වා අට්ඨාරස මහාවිහාරා හොන්ති, තෙ සබ්බෙපි ඡඩ්ඩිත-පතිතඋක්ලාපා අහෙසුං. භගවතො හි පරිනිබ්බානෙ සබ්බෙපි භික්ඛූ අත්තනො අත්තනො පත්තචීවරමාදාය විහාරෙ ච පරිවෙණෙ ච ඡඩ්ඩෙත්වා අගමංසු. තත්ථ කතිකවත්තං කුරුමානා ථෙරා භගවතො වචනපූජනත්ථං තිත්ථියවාද-පරිමොචනත්ථඤ්ච – 'පඨමං මාසං ඛණ්ඩඵුල්ලප්පටිසඞ්ඛරණං කරොමා'ති චින්තෙසුං. තිත්ථියා හි එවං වදෙය්‍යුං – ''සමණස්ස ගොතමස්ස සාවකා සත්ථරි ඨිතෙයෙව විහාරෙ පටිජග්ගිංසු, පරිනිබ්බුතෙ ඡඩ්ඩෙසුං, කුලානං මහාධන-පරිච්චාගො විනස්සතී''ති. තෙසඤ්ච වාදපරිමොචනත්ථං චින්තෙසුන්ති වුත්තං හොති. එවං චින්තයිත්වා ච පන කතිකවත්තං කරිංසු. යං සන්ධාය වුත්තං –

"අථ ඛො ථෙරානං භික්ඛූනං එතදහොසි – භගවතා, ඛො ආවුසො, ඛණ්ඩඵුල්ලප්පටිසඞ්ඛරණං වණ්ණිතං, හන්ද මයං, ආවුසො, පඨමං මාසං ඛණ්ඩඵුල්ලප්පටිසඞ්ඛරණං කරොම, මජ්ඣිමං මාසං සන්නිපතිත්වා ධම්මඤ්ච විනයඤ්ච සඞ්ගායිස්සාමා"ති.

(සු.වි. බාහිර නිදානවණ්ණනා)

(ආ) මහතෙරවරුන් විසින් ශාසනයේ චිරස්ථිතිය සඳහා ගනු ලැබූ ඇතැම් ක්‍රියාමාර්ග පිළිබඳ සුමංගලවිලාසිනී බාහිර නිදාන වර්ණනාව දක්වන අදහස්වල වැදගත්කම පරීක්ෂා කරන්න.

=====

UNIVERSITY OF PERADENIYA
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION
දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) – ............ 2020
ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - 2020

# PALI - II / පාලි II - (PLG 2)

## (අනිර්දිෂ්ට ග්‍රන්ථ, ගද්‍ය රචනය හා පාලි ව්‍යාකරණ)

පළමු වන කොටසෙහි ප්‍රශ්න සියල්ලට ම හා
දෙවන කොටසින් ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.
(මෙම පත්‍රයට ඇතුළත් ප්‍රශ්න සංඛ්‍යාව 07 කි.)

(කාලය පැය තුනයි )

## I - කොටස

1. (අ) සිංහලට නගන්න.

අථ ඛො, භික්ඛවෙ, දෙවා තාවතිංසා යෙන සක්කො දෙවානමින්දො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා සක්කං දෙවානමින්දං එතදවොචුං - ඉධ තෙ, මාරිස, අඤ්ඤතරො යක්ඛො දුබ්බණ්ණො ඔකොටිමකො සක්කස්ස දෙවානමින්දස්ස ආසනෙ නිසින්නො. තත්‍ර සුදං, මාරිස, දෙවා තාවතිංසා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති - අච්ඡරියං වත, භො, අබ්භුතං වත, භො! අයං යක්ඛො දුබ්බණ්ණො ඔකොටිමකො සක්කස්ස දෙවානමින්දස්ස ආසනෙ නිසින්නොති. යථා යථා ඛො, මාරිස, දෙවා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති, තථා තථා සො යක්ඛො අභිරූපතරො චෙව හොති දස්සනීයතරො ච පාසාදිකතරො චාති. සො හි නූන, මාරිස, කොධභක්ඛො යක්ඛො භවිස්සතී'ති.
අථ ඛො, භික්ඛවෙ, සක්කො දෙවානමින්දො යෙන සො කොධභක්ඛො යක්ඛො තෙනුපසඞ්කමි; උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා දක්ඛිණජාණුමණ්ඩලං පථවියං නිහන්ත්වා යෙන සො කොධභක්ඛො යක්ඛො තෙනඤ්ජලිං පණාමෙත්වා තික්ඛත්තුං නාමං සාවෙති - 'සක්කාහං මාරිස, දෙවානමින්දො, සක්කාහං, මාරිස, දෙවානමින්දො ති. යථා යථා ඛො, භික්ඛවෙ, සක්කො දෙවානමින්දො නාමං සාවෙසි, තථා තථා සො යක්ඛො දුබ්බණ්ණතරො චෙව අහොසි ඔකොටිමකතරො ච. දුබ්බණ්ණතරො චෙව හුත්වා ඔකොටිමකතරො ච තත්ථෙවන්තරධායී'ති.

(දුබ්බණ්ණිය සුත්තං)

(ආ) ඉරි ඇඳි පදවලට ව්‍යාකරණ විවරණ සපයන්න.

අනෙක් පිටුවට ....

2. (අ) සිංහලට නගන්න.

නග්ගා දුබ්බණ්ණරූපාසි - කිසා ධමනිසන්ථතා,
උප්ඵාසුලිකෙ කිසිකෙ - කා නු ත්වං ඉධ තිට්ඨසී'ති.

අහං මත්තා තුවං තිස්සා - සපත්තී තෙ පුරෙ අහුං,
පාපකම්මං කරිත්වාන - පෙතලොකං ඉතො ගතා'ති.

කිං නු කායෙන වාචාය - මනසා දුක්කටං කතං,
කිස්ස කම්මවිපාකෙන - පෙතලොකං ඉතො ගතා'ති.

චණ්ඩී ච ඵරුසා චාසිං - ඉස්සුකී මච්ඡරී සඨා,
තාහං දුරුත්තං වත්වාන - පෙතලොකං ඉතො ගතා'ති.
සබ්බං අහම්පි ජානාමි - යථා ත්වං චණ්ඩිකා අහු,
අඤ්ඤඤ්ච ඛො තං පුච්ඡාමි - කෙනාසි පංසුකුන්ථිතා'ති

සීසංන්හාතා තුවං ආසි - සුචිවත්ථා අලඞ්කතා,
අහඤ්ච ඛො අධිමත්තං - සමලඞ්කතතරා තයා.

තස්සා මෙ පෙක්ඛමානාය - සාමිකෙන සමන්තයි,
තතො මෙ ඉස්සා විපුලා - කොධො මෙ සමජායථ.

තතො පංසුං ගහෙත්වාන - පංසුනා තං හි ඔකිරිං,
තස්ස කම්මවිපාකෙන - තෙනම්හි පංසුකුන්ථිතා'ති.

(උබ්බරිවග්ග)

(ආ) ඉරි ඇඳි පදවලට ව්‍යාකරණ විවරණ සපයන්න.

අනෙක් පිටුවට ....

3. පාලියට නගන්න.

මහණෙනි, මහණ තෙමේ කෙසේ නම් කයෙහි කය අනුව බලමින් වාසය කරන්නේ ද යත්, මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම කැලයකට ගියේ හෝ ගසක් මුලකට ගියේ හෝ, හිස් ගෙයකට ගියේ හෝ, පර්යංකය බැඳ ශරීරය කෙළින් පිහිටුවා ගෙන සිහිය ඉදිරිපත් කොට තබා ගෙන හිඳින්නේය. හෙතෙම සිහියෙන්ම ආශ්වාස කරන්නේය, සිහියෙන්ම ප්‍රාශ්වාස කරන්නේය, දීර්ඝ කොට ආශ්වාස කරන්නේ හෝ 'දීර්ඝ කොට ආශ්වාස කරන්නෙමි'යි දන්නේය. දීර්ඝ කොට ප්‍රාශ්වාස කරන්නේ හෝ දීර්ඝ කොට ප්‍රාශ්වාස කරන්නෙමියි' දන්නේය. ලුහුඬු කොට ආශ්වාස කරන්නේ හෝ 'ලුහුඬුකොට ආශ්වාස කරන්නෙමියි' දන්නේය. ලුහුඬු කොට ප්‍රාශ්වාස කරන්නේ හෝ 'ලුහුඬු කොට ප්‍රාශ්වාස කරන්නෙමියි' දන්නේය. මුල මැද අග යන සියලු ආශ්වාසය ප්‍රකට කරගන්නෙමියි යන අදහසින් 'ආශ්වාස කරන්නෙමියි' පුරුදු කරන්නේය. මුල මැද අග යන සියලු ප්‍රාශ්වාසය දැන ප්‍රකට කරගන්නෙමියි යන අදහසින් ප්‍රාශ්වාස කරන්නෙමියි' පුරුදු කරගන්නේය. ආශ්වාස ප්‍රාශ්වාසයන් සංසිඳුවමි යන අදහසින් ආශ්වාස කරන්නෙමියි' පුරුදු කරන්නේය. ආශ්වාස ප්‍රාශ්වාස සංසිඳුවමි යන අදහසින් ප්‍රාශ්වාස කරන්නෙමියි පුරුදු කරන්නේය.

(සතිපට්ඨාන සූත්‍රය)

## II - කොටස

4. පාලි භාෂාවේ ස්වර සන්ධිය සනිදර්ශනව පැහැදිලි කරන්න.

5. පාලි භාෂාවේ කම්මධාර සමාසයෙහි විවිධ ප්‍රයෝග නිදසුන් සහිතව විස්තර කරන්න.

6. 'පච' ධාතුව අජ්ජතනී අත්තනො හා පරස්සපදයෙහි වරනඟන්න.

7. පහත දැක්වෙන මාතෘකාවලින් දෙකක් සඳහා ව්‍යාකරණ සටහන් ලියන්න.

I. තද්ධිත
II. උපසග්ග
III. නාම විභත්ති
IV. නිපාත
V. කාරක

==========

පේරාදෙණිය විශ්වවිද්‍යාලය

# UNIVERSITY OF PERADENIYA

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

## CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL- OLD SYLLABUS) –2020

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර - පැරණි නිර්දේශය) - 2020

## පාලි - III/ Pali - III/ (PLG -III)

## (පාලි සාහිත්‍ය ඉතිහාසය හා බෞද්ධ චින්තාව)

**ප්‍රශ්න පහකට පමණක්** පිළිතුරු සපයන්න.

(එක් කොටසකින් යටත් පිරිසෙන් ප්‍රශ්න **දෙකක්වත්** තෝරාගන්න.)

(මෙම පත්‍රයට ඇතුළත් ප්‍රශ්න සංඛ්‍යාව 10 කි.) (කාලය : පැය තුනයි)

## I - කොටස

1. පළමු ධර්ම සංගායනාව හා එහි ප්‍රතිඵල චුල්ලවග්ගපාළියේ පඤ්චසතිකක්ඛන්ධකය ඇසුරෙන් පැහැදිලි කරන්න.

2. අභිධර්ම සාහිත්‍යයේ ප්‍රභවය පිළිබඳ අට්ඨකථාවලින් නිරූපණය වන සාධක පරීක්ෂා කරන්න.

3. 'පූජනීය වස්තු පාලි වංසකථා රචනා කිරීම සඳහා වස්තු විෂය සැපයීය.' පාලි වංසකථා සාහිත්‍යය ඇසුරෙන් සාකච්ඡා කරන්න.

4. පාලි අට්ඨකථාචාර්යවරුන්ගෙන් සිදු සේවය අගය කරන්න.

5. පාලි ටීකා රචනා කිරීමෙහි අරමුණු සාකච්ඡා කර එහි වර්ධනය පැහැදිලි කරන්න.

## II - කොටස

6. අරහත් සංකල්පය පිළිබඳ පශ්චාත්කාලීන නිකායික මතවාද පරීක්ෂා කරන්න..

7. යෝගාචාරිකයන්ගේ ආලයවිඥාන සංකල්පය සෙසු සම්ප්‍රදායාගත විඥානය පිළිබඳ ඉගැන්වීම් හා තුලනය කරන්න.

**අනෙක් පිටුව...**

8. රූප විභාගය පිළිබඳව හීනයාන හා මහායාන ඉගැන්වීම් ඇසුරෙන් විමර්ශනයක් කරන්න.

9. මධ්‍යමක සම්ප්‍රදායේ ආරම්භය හා වර්ධනය විෂයෙහි එම සම්ප්‍රදායේ ආචාර්යවරුන්ගෙන් ඉටු වූ සේවය අගය කරන්න.

10. සර්වාස්තිවාදීන්ගේ අභිධර්මයෙහි මූලික ඉගැන්වීම් පිළිබඳ විමසුමක් කරන්න.

==========